**ගොවිජන සංවර්ධන අරමුදල - 2015**

------------------------------------------

ගොවිජන සංවර්ධන අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 97(5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි .

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල සංචලනය පෙන්නුම් කිරීම සඳහා ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල දරන ලද රු. 2,447,350 ක ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් වර්ෂයේ වියදමක් ලෙස ආදායමට එරෙහිව කපා හැර තිබුණි.

(ආ) වර්ෂ පහකට වඩා වැඩි කාලයක සිට ගිණුම් වල ජංගම බැරකම් ලෙස දක්වා තිබූ රාජ්‍ය ආදායමට බැර නොකළ එකතුව රු. 10,746,805 ක් වූ ඉසින යන්ත්‍ර තැන්පත් ගිණුමේ හා බුල්ඩෝසර් සේවා තැන්පත් ගිණුමේ ශේෂ සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඇ) අරමුදල සතුව පැවති ප්‍රකාශන හා සිතියම් වර්ෂය අවසානයට භෞතිකව සත්‍යාපනය කර නොතිබූ අතර පොත් ශේෂ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. කරන ලද විගණන පරීක්ෂණයට අනුව රු. 2,320,800 ක ප්‍රකාශන පොත් නිකුත් කිරීම් හා වර්ෂය අවසානයට ඉතිරිව තිබූ රු. 354,400 ක් වටිනා සිතියම් හා කන්න රැස්වීම් අත්පොත් ගිණුම්වලින් අත්හැරී තිබූ බව නිරීක්ෂණය විය.

### 2.3 පැහැදිලි නොකල වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ මුදල් ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව මුදල් ශේෂය අතර 2008 වර්ෂයේ සිට පැවත එන රු. 651,797 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ජපන් යෙන් ආධාර වැඩසටහන යටතේ බෙදාදුන් ට්‍රැක්ටර් සඳහා සමාලෝචිත වර්ෂය තුල අයවී ඇති වාරික මුදල් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගය හා සංවර්ධන අංශයෙන් ඉදිරිපත්කර ඇති උප ලේඛනයේ අගය අතර, රු. 6,477,732 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව අක්කර බදු ආදායම රු.19,712,878 ක් වුවද සංවර්ධන අංශයේ ප්‍රගති වාර්තාවට අනුව එය රු.13,942,012 ක් වූයෙන් රු. 5,770,866 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1995 වර්ෂයේදී ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ගොවි සංවිධාන වෙත ලබා දී තිබුණු ට්‍රැක්ටර් ට්‍රේලර් සඳහා 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ වාරික මුදල රු.6,194,575 ක් වූ අතර එය අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙනුවෙන් ගෙවා තිබූ රු.16,650 ක විගණන ගාස්තු හා වනාතවිල්ලුව පටකරෝපන විද්‍යාගාරය ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේදී ලබාදී තිබුණු රු.543,000 ක අත්තිකාරම් මුදල් අයකර ගැනීම සඳහා සක්‍රීය වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

දිස්ත්‍රික්ක 05 ක ගොවි සංවිධාන නියෝජිතයින් පුහුණු කිරීම හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් පුහුණු කිරීමේ වැඩ සටහන සඳහා රු. 415,676 ක මුදලක් වියදම් කර තිබුණ ද සහභාගී වූවන්ගේ අත්සන් ලේඛණයක් ඉදිරිපත් කර නොතිබුණි.

**2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව 2015 වර්ෂයේදි ලබාගෙන තිබූ රු. 538,459 ක අත්තිකාරම් 2016 මාර්තු අවසානය වන විටත් පියවා නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.30,368,913 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,096,452 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 15,272,461 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොකරන ලද රු.10,746,805 ක වගකීම් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කිරීමත්, අක්කරබදු ආදායම රු. 3,396,556 කින් වැඩිවීමත්, ක්ෂය වියදම රු. 220,000 කින් අඩුවීමත් මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ ප්‍රධාන අරමුණු ලෙස නව කෘෂිකර්මික ප්‍රතිපත්ති බලාත්මක කිරීම, සැපයුම වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම, ගොවිජන කේන්ද්‍රය පරිපාලනය කිරීම හා සංවර්ධනය කිරීම, මධ්‍යස්ථානවල ගොඩනැගිලි,වාහන හා උපකරණ නඩත්තු කිරීම, නිලධාරීන් පුහුණු කිරීම දක්වා තිබුණි.

(ආ) අයවැය ඇස්තමේන්තුවට අනුව දේශිය වී නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා රු. 1,000,000 ක් වෙන්කර තිබුණ ද එම කාර්යය ඉටු කර නොතිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජපන් යෙන් ආධාර වැඩසටහන යටතේ කෘෂි කර්ම අමාත්‍යාංශය මගින් බෙදාදුන් ට්‍රැක්ටර් සහ ජල පොම්ප සඳහා වාරික අයකර ගැනීම ඉතා මන්දගාමී තත්ත්වයක පැවති අතර 2015 දෙසැම්බර් 31 දිනට හිඟ වාරික මුදල රු.408,794,219 ක් විය. මෙම හිඟ වාරික මුදල තුල ඇතුලත් රෝද 02 ට්‍රැක්ටර් 491 ක් හා රෝද 04 ට්‍රැක්ටර් 440 ක් සඳහා 2015 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. 11,663,259 ක් හා රු. 139,473,690 ක් වසර 03 ත් 30 ත් අතර කාලයක සිට හිඟව තිබූ අතර 2015 වර්ෂය තුලදී කිසිදු වාරිකයක් අයවී නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ දිස්ත්‍රික්ක 02 කට ලබා දී තිබූ වතුර පොම්ප 54 ක් සඳහා 2015 දෙසැම්බර් 31 දිනට රු. 1,041,261 හිඟව තිබුණ අතර 2015 වර්ෂය තුලදී මෙම වතුර පොම්ප සඳහා කිසිදු වාරිකයක් අයවී නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයට පෙර හඳුනාගෙන තිබුණු රු. 450,000 ක තොග ඌනතාවයට වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදි රු.1,180,100 ක ජල පොම්ප වාරික මුදල් ලැබී තිබුණු අතර ඉන් රු.500,000 ක් පමණක් අමාත්‍යාංශය වෙත යවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---

**5.1 අයවැය පාලනය**

---

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත ආදායම් සහ වියදම්, තථ්‍ය ආදායම් සහ වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) අයවැය පාලනය - අයවැය ගත ආදායම් සහ වියදම් තථ්‍ය ආදායම් සහ වියදම් අතර විචලනය අඩුකර ගැනීම.

(ආ) වත්කම් කළමනාකරණය - තොග නිවැරදිව ගිණුම්ගත කිරීම හා භෞතිකව සත්‍යාක්ෂණය කිරීම.

(ඇ) තැන්පතු ගිණුම් නිරවුල් කිරීම - 2008 වර්ෂයේ සිට පැවත එන භාණ්ඩාගාර පොත් අනුව ශේෂය සහ අරමුදලේ මුදල් ශේෂයේ වෙනස නිරවුල් කිරීම.

(ඈ) ණය අයකර ගැනීම- 1995 වර්ෂයේ සිට හිඟ ට්‍රැක්ටර් ණය වාරික අයකර ගැනීම.